සියවස් ප්‍රකාශනයකි

රබර් වගාවට අත්වැලක්

සම්පාදනය

ආචාර්ය පී. සෙනෙවිරත්න

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය



රබර් වගාවට අත්වැලක්

ආචාර්ය පී. සෙනෙවිරත්න

පළමු මුද්‍රණය 2009

දෙවන මුද්‍රණය 2016

ISBN: 978-955-9022-13-8

ප්‍රකාශනය - ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

මුද්‍රණය - සී.පී. ප්‍රින්ටර්ස්, 204 සී, දුම්රියපොළ පාර,
උඩහමුල්ල, නුගේගොඩ

දෙවෙනි මුද්‍රණය සඳහා පෙර වදන

“රබර් වගාවට අත්වැලක්" වනාහී රබර් වගාවේදී පැණ නගින ගැටළු ඒ ආකාරයෙන් ඉදිරිපත් කර ඒවා සඳහා පිළිතුරු සපයා ඇති පොත් පිංචකි. මෙය ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයට සිය වසක් සපිරීම නිමිති කර ගෙන ප්‍රකාශයට පත් කෙරුණි.

මෙහි සඳහන් වන බොහෝ ප්‍රශ්ණ හා පිළිතුරු රබර් පර්යේෂණායතනයේ එවකට සේවය කල විද්‍යාඥයින් විසින් ඔවුන්ගේ පර්යේෂණ කටයුතු වලදී ලැබූ අත්දැකිම් හා ක්ෂේත්‍ර ගැටළු අළලා ප්‍රශ්ණ හා පිළිතුරු ආකාරයට ඉදිරිපත් කර ඇත. එබැවින් මෙම ග්‍රන්ථයේ ඇතුලත් කරුණු රබර් වගාකරුවන් හට මග පෙන්වන්නක් ලෙස පමණක් නොව වගාවේ නිර්දේශවල සිද්ධාන්තමය පසුබිම දැණ ගැනීම සඳහා ද මහත්සේ උපකාරී වනු ඇත.

මෙහිදී ප්‍රශ්ණ හා පිළිතුරු සැපයීමෙන් මෙම පොත් පිංච නිර්මාණකරනයට දායකවූ මෙහි අවසාන පිටු කිහිපයේ නම් සඳහන් වන සියලු නිලධාරීන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර, මෙය සැකසීමේදී මා හට නොමද සහයක් දැක්වූ ජී.ඒ.එස්. විජේසේකර, ඩී.ර්.ජයවර්ධන සහ ඒ ද අල්මේදා යන මහත්මින් හටද මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

එමෙන්ම මේ සඳහා එවකට රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂව සිටි, ආචාර්ය ඒ. නුගවෙල මහතා හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජීව විද්‍යා) ආචාර්ය සී.කේ. ජයසිංහ මහතා විසින් දක්වන ලද සහයෝගය හා මඟ පෙන්වීම කෘතවේදිව සිහිපත් කරමි.

රබර් වගාව පිළිබඳව මූලික දැනුමක් සරල බසින් ලබා දීමේ අවශ්‍යතාවය කිසියම් දුරකට මෙම පොතින් පිරිමැසුණු බව සැබෑවකි. මෙහි අඩංගු කරුණු ප්‍රශ්ණ හා පිළිතුරු ක්‍රමයෙන් බැහැරව තව දුරටත් විස්තර සහිතව ලියා එළිදැක්වීමට බලාපොරොත්තු වුවද, එය මේ වනතුරුත් සිදු නොවූ බැවින් සහ මෙම පොතට පාඨකයන් දැක්වූ කැමැත්ත නිසා තව වරක් මෙය මෙලෙසින්ම මුද්‍රණය කිරීමට තීරණය කරන ලදී. මෙහි අන්තර්ගතය රබර් ගස හා වගාව පිළිබඳව මූලික තාක්ෂණික කරුණු වන අතර ඒවායේ වෙනස් කමක් සිදුවී නොමැත.

ආචාර්ය පී. සෙනෙවිරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂක පර්යේෂණ (ජීව)
2016.08.31

1. රබර් ශාකය හඳුන්වන විද්‍යාත්මක නාමය කුමක්ද?

හෙවියා බ්‍රසිලිඑන්සිස් *Hevea brasiliensis* (Willd ex A.Juss,) Müll Arg.

2. රබර් ශාකයේ නිවැරදි වර්ගීකරණය කුමක්ද?

රාජධානිය	-	ප්ලාන්ටේ	Kingdom	-	Plantae
වංශය	-	ට්‍රැකියෝෆයිටා,	Phylum	-	Tracheophyta
වර්ගය	-	ඇන්ජියොස්පර්මේ	Class	-	Angiospermae
උප වර්ගය	-	ද්වී බීජ පත්‍රී	Sub Class	-	Dicotyledon
කාණ්ඩය	-	ආකික්ලමයිඩේ	Group	-	Arachichlamydea
ගෝත්‍රය	-	ජෙරනියාලේ	Order	-	Geraniales
කුලය	-	ඉයුෆෝබියේසියේ	Family	-	Euphorbiaceae
ඝණය	-	හෙවියා	Genus	-	*Hevea*
විශේෂය	-	බ්‍රසීලිඑන්සිස්	Species	-	*brasiliensis*

Source: Sinnott & Wilson (1955) Botany Principles and Problems (325 - 473)

3. හෙවියා ගණයට අයත් අනෙකුත් රබර් ශාක විශේෂ මොනවාද?

ශාක විශේෂ 11ක් ඇත. ඉන් සමහරක් නම්,

- *හෙවියා නිටිඩා* (*Hevea nitida*)
- *හෙවියා ගයිනෙන්සිස්* (*Hevea guianensis*)
- *හෙවියා බෙන්තමියානා* (*Hevea benthamiana*)
- *හෙවියා පෝසිෆ්ලෝරා* (*Hevea pauciflora*)
- *හෙවියා කැම්පෝරම්* (*Hevea camporum*)
- *හෙවියා ස්පෘසියානා* (*Hevea spruciana*)
- *හෙවියා රිජිඩිෆෝලියා* (*Hevea rigidifolia*)
- හෙවියා මයික්‍රොෆයිලා (*Hevea microphylla*)

4. රබර් ශාකයේ නිජබිම කුමක්ද?

දකුණු ඇමෙරිකාවේ බ්‍රසීලය.

5. රබර් ශාකය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ කිනම් වර්ෂයේද?

වර්ෂ 1876 දී

6. ලෝකයේ පැරණිතම රබර් පර්යේෂණායතනය පිහිටා ඇත්තේ කොහිද?

ශ්‍රී ලංකාවේ

7. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණායතනය පිහිටියේ කොහිද?

කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්තේ, ඩාර්ටන්ෆීල්ඩ් වතුයායේ.

8. රබර් ගසේ වර්ධනයට යෝග්‍ය උෂ්ණත්වය කුමක්ද?

23° - 28° C අතර පැවතිය යුතු අතර, 20° C ට වඩා අඩු උෂ්ණත්වයක සති කිහිපයකට වඩා නොපැවතිය යුතුය.

9. රබර් ගසේ ප්‍රශස්ථ වර්ධනයට අවශ්‍ය අනෙකුත් දේශගුණික තත්වයන් මොනවාද?

ඉහළ ආර්ද්‍රතාවය නිසා ගසට අවශ්‍ය තෙතමනය උරා ගත හැකිවීමෙන් ගසෙහි වර්ධනය වැඩි දියුණු වේ. සූර්යයාලෝකය ලැබෙන කාලය හා ආලෝක තීව්‍රතාවය ගසෙහි නිපදවන රබර් කිරිවල ඇති සුක්රෝස් ප්‍රමාණය නීර්ණය කරයි.

10. රබර් වගාව සඳහා භාවිතා වන පාංශු ශ්‍රේණි මොනවාද?

විවිධ සම්භවයෙන් මෙන්ම විවිධ රූප විද්‍යාත්මක ලක්ෂණ වලින් හෙබි බොහෝ පස් වර්ග, සරු රබර් වගාවක් සඳහා උපකාරී වේ. සාම්ප්‍රදායික රබර් වවන ප්‍රදේශවල පහත සඳහන් පාංශු ශ්‍රේණි වගාව සඳහා යොදා ගනී.

අගලවත්ත, හෝමාගම, රත්නපුර, පාරඹේ, බොරලු හා දෙනිය ශ්‍රේණි.

11. රබර් ගසේ වර්ධනය සඳහා පසේ තිබිය යුතු භෞතික ගුණ මොනවාද?

සෙ.මී. 100 දක්වා ගැඹුරු, හොඳින් ජල වහනය වන, වාතනය වූ, හොඳ පාංශු ව්‍යුහයක් සහ හොඳ ජල ධාරිතාවයක් ඇති, 35% මැටි සහ 30-35% වැලි සහිත පාංශු වයනයක් ඇති පස්.

12. ලංකාවේ රබර් වවන ප්‍රධාන දිස්ත්‍රික්ක මොනවාද?

කෑගල්ල, කළුතර, රත්නපුර, ගාල්ල, මොණරාගල, කොළඹ සහ ගම්පහ.

13. ශ්‍රී ලංකාවේ පළමු වරට ස්වභාවික රබර් ආශ්‍රිත පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලද්දේ කිනම් වර්ෂයේද?

වර්ෂ 1909 දී

14. රබර් සඳහා තිබිය යුතු භූවිෂමතාවය කුමක්ද?

සමකයේ සිට අක්ශාංශ 10° ක් ඇතුළත, උස මුහුදු මට්ටමේ සිට මීටර් 500 ට වඩා අඩුවූ බිම්වල

15. රබර් සඳහා යෝග්‍ය වාර්ෂික වර්ෂාපතනය කුමක්ද?

මි.මි. 1,650 - 3,000 ත් අතර සමව විසිරුණු වර්ෂාපතනයක්.

16. “ක්ලෝන” යනු කුමක්ද?

ප්‍රවේණි විද්‍යාත්මක ලක්ෂණ අතින් මව් පරම්පරාවට සෑම අතින්ම සර්ව සමවූ අළුතින් බිහි කරනු ලබන පරම්පරාව.

17. රබර් ශාක අභිජනනයේදී කරනු ලබන්නේ කුමක්ද?

තෝරාගත් ක්ලෝනයක ස්ත්‍රී මල්, තෝරා ගත් ක්ලෝනයකින් ඉවත් කර ගන්නා ලද පරාග යොදාගෙන කෘතිමව පරාගනය කිරීම.

18. ප්‍රවේණි විද්‍යාත්මකව වැඩි දියුණු කරන ලද රෝපණ ද්‍රව්‍යවල ඇති වැදගත්කම කුමක්ද?

- ඉහළ අස්වැන්නක් සහ වැඩි වර්ධන වේගයකින් යුක්ත වීම.
- ආවේණික ගති ලක්ෂණ දන්නා බැවින්, කරනු ලබන ආයෝජනයන්ගේ ප්‍රතිඵලය කල් තබා දැනගත හැකිවීම.
- බොහෝ පත්‍ර රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව සහ වැඩි දැව වටිනාකමක් තිබීම.
- පොත්ත වියළීයාමේ රෝගයට ඔරොත්තු දීම.
- සුළං හානිවලට ප්‍රතිරෝධීවීම.

19. වගා ක්ෂේත්‍රය සඳහා සුදුසු ක්ලෝනයක් තෝරා ගැනීමේදී ඔබ සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

සියළුම ගුණාත්මක ලක්ෂණ සහිත එක ක්ලෝනයක් නිපදවීම ඉතා දුෂ්කර කාර්යයක් වන බැවින්, වගාව සඳහා සුදුසු ක්ලෝනයක් ක්ෂේත්‍රයේ තත්වය මත තෝරාගත යුතුය. එනම්,

- උච්චත්වය (මුහුදු මට්ටමේ සිට උස) සහ භූවිෂමතාවය.
- වර්ෂාපතනය.
- වතුයායේ දැනට පවතින ක්ලෝන සංයුතිය.

20. රබර් ශාක අභිජණනයේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියේ මූලික අරමුණු මොනවාද?

වැඩි ඵලදායිතාවයක් සහ පහත සඳහන් අනෙකුත් ද්විතියික ලක්ෂණ සහිත ක්ලෝන නිපදවීම.

- රෝගවලට ඔරොත්තු දීම
- රබර් කිරිවල ගුණාත්මක බව.
- ඉහළ දැවමය වටිනාකමක් තිබීම.

21. රබර් සඳහා අංකුර බද්ධය මුල් වරට සොයාගත්තේ කවදාද?

1917, වැන් හෙල්ටන් (ජාවාහි, ලන්දේසි ජාතික උද්‍යාන විද්‍යාඥයෙකි)

22. ශක්තිමත් පැළ ලබා දෙන රබර් ඇට තෝරා ගන්නේ කෙසේද?

බීජ පතනයේදී මුලින්ම පතනය වන, දිලිසෙන මතුපිටක් සහිත බරින් වැඩි, බීජ තෝරා, ප්‍රරෝහණ තවාන්වල බීජ වැපිරීමෙන් පසු ප්‍රථමයෙන්ම ප්‍රරෝහණය වන බීජ පමණක් තෝරා ගැනීමෙන් (ප්‍රථමයෙන් පැළ වෙන 50%)

23. විවිධ ක්ලෝන වල රබර් බීජ රූපාකාරයෙන් වෙනස් වන්නේද?.

විවිධ ක්ලෝනයන්ගේ රබර් බීජ ප්‍රමාණයෙන්, හැඩයෙන්, බරින් සහ පැහැයෙන් විවිධ වේ.

24. රබර් ඇටවල ජීව්‍ය කාලය කුමක්ද?

දින 14 සිට 21 දක්වා



25. රබර් බීජ සඳහා ප්‍රරෝහණ තවානක් සකස් කර ගන්නේ කෙසේද?

සෙ.මී. 5ක් පමණ ඝනකමට පිරිසිදු ගංගා වැලි ඇතිරූ පාත්තියක් (වර්ග මීටරයක පාත්තියක රබර් ඇට 1,000ක් පමණ ඇතිරිය හැක).

26. ප්‍රරෝහණ තවානක තිබිය යුතු අවශ්‍යතා මොනවාද?

සෙවණ සහිත තැනක් වීම, පිරිසිදු ගංගා වැලි භාවිතා කිරීම, තෙතමනය හොඳින් සැපයිය හැකි වීම, කෘමි සහ පළිබෝධ හානි අවම වීම.

27. ප්‍රරෝහණ තවානක් භාවිතයෙන් හොඳ රබර් පැළ තේරීමේ ක්‍රියාවලියේ වැදගත්කම කුමක්ද?

ශක්තිමත්ව වැඩෙන පැළ තෝරා ගැනීම සඳහා පවතින එකම ක්‍රමය මෙය වන අතර, මුලින් ප්‍රරෝහණය වන බීජ ශක්තිමත් පැළ ලබා දෙයි.

28. බීජ පැළයක් බද්ධ කිරීමට කොපමණ කාලයක් වර්ධනය විය යුතුද?

ළපටි බද්ධ ක්‍රමයට පැළ නිපදවීමට බෑග් වල වැඩෙන පැළ නම්, මාස 3-4 පමණ.

29. ළපටි බද්ධ ක්‍රමයට බද්ධ කිරීමේදී බීජ පැළයේ අවම වර්ධන මට්ටම කුමක්ද?

බෑගයේ පස් මට්ටමේ සිට සෙ.මි.1 ක් ඉහළින් පැළයේ විෂ්කම්භය මි.මි.6 ක් පමණ වූ විට (පැන්සලයක මහත).

30. මේ සඳහා භාවිතා කල යුතු බද්ධ අතු වල වයස කොපමණද?

බද්ධ අතු පැළය කප්පාදු කර සති 6-8 දක්වා වර්ධනය වූ අතු.

31. බද්ධ අංකුරය වෙන් කර ගන්නේ කෙසේද?

ඉතා මුවහත් බද්ධ පිහියක් හෝ කඩදාසි කපන තල මාරු කරන පිහියක් භාවිතා කොට ලීයේ කොටසක් සමග බද්ධ අංකුරය කපා ගත යුතු අතර, බද්ධ අංකුරයට හානි නොවන සේ ලී කැබැල්ල ඉවත් කර ගත යුතුය.

32. හරිත බද්ධ කිරීම සඳහා භාවිතා කරන පොලිතීන් වර්ගය කුමක්ද?

මාන 150 අවර්ණ පොලිතීන් වලින් දික් අතට අඟලක් පළලට කපා ගත් පොලිතීන් පටි.

33. අංකුරය සාර්ථකව ගසට බද්ධ වීමට කොපමණ කාලයක් බද්ධයේ වෙළුම තැබිය යුතුද?

සති 3 ක් (දින 21).

34. බද්ධය සාර්ථක බව දැන ගන්නේ කෙසේද?

හරිත බද්ධ අංකුරවල ඒවායේ කොළ පැහැය පැවතීම මගින් බද්ධය සාර්ථක බව පෙන්වයි.

35. බද්ධය සාර්ථක වු ගස් වල ග්‍රාහක ශාකය කපා ඉවත් කරනුයේ කුමන අවස්ථාවේදී ද?

බද්ධ කිරීමෙන් සති තුනකට පසු පොලිතීන් වෙළුම ඉවත් කර තවත් දින 10කට පසු ග්‍රාහක ගස කපා ඉවත් කල හැක.

36. බද්ධය සාර්ථක වූ පැළ වල ග්‍රාහක ශාකය කපා ඉවත් කල යුතු ආකාරය කෙසේද?

බද්ධ අංකුරයට අගල් 6 ක් ඉහළින් 45° බැවුමක් සිටින සේ.

37. බද්ධය අසාර්ථක වුවහොත් කුමක් කල යුතුද?

පැළයේ අනෙක් පැත්ත බද්ධ කල හැකිය. මෙහිදී ගසේ පොත්ත සම්පූර්ණ රවුමක්ම ඉවත් නොකිරීමට වග බලා ගත යුතු වේ.



38. බද්ධ කිරීමට සුදුසු කාළගුණික තත්ව මොනවාද?

වර්ෂාව නොමැති දිනවල උදේ කාලයේ සහ හවස් කාලයේදී (අධිකව හිරු රශ්මිය ඇති වේලාවන් එතරම් සුදුසු නොවේ).



39. බද්ධ අතු තවානක උපරිම ජීවන කාලය වසර 10කට සීමා කර ඇත්තේ ඇයි?

කල් ගත වෙත්ම බද්ධ අතු තවානේ ශාක පරිණත (මේරූ) ලක්ෂණ ලබා ගන්නා බැවින්, වයස අවුරුදු 10 ට වැඩි ශාක වලින් ලබා ගන්නා බද්ධ අංකුර ගුණාත්මක බවින් අඩු වන බැවිනි.

40. බද්ධ අතු තවාන් වාර්ෂිකව කප්පාදු කිරීමේ වැදගත්කම කුමක්ද?

සෑම ශාකයකම වයස්ගත වීමේ ප්‍රවණතාව ශාකයේ මුලට ආසන්නව කප්පාදු කිරීමෙන් අඩුකර ගත හැක. එබැවින් අපරිණත ලක්ෂණ දිගටම පවත්වා ගැනීමට මෙම කප්පාදු කිරීම අවශ්‍යවේ.

41. බද්ධ අතුවල ඇති බද්ධ අංකුර ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග කවරේද?

බද්ධ අතුවල පහළ ඇති පත්‍ර, බද්ධ අතු කපා ගැනීමට සති 2-3 කට පෙර කපා ඉවත් කිරීමෙන් බද්ධ අංකුර ප්‍රමාණය වැඩි කර ගත හැක.



42. බද්ධ අතු ප්‍රවාහණය කල හැකිද?

ළපටි බද්ධ අතු ප්‍රවාහණය සාර්ථක නැත.

43. එක් බද්ධ අතු පැළයකින් ලබා ගත හැකි අංකුර ගණන කොපමණද?

මෙය ගසේ වයස හා අතු ගණන මත රඳා පවතී. (සාමාන්‍යයෙන් 50 පමණ). දුඹුරු බද්ධ අතු යාරයක බද්ධ අංකුර 15-20 පමණ ඇති අතර, හරිත බද්ධ අත්තක අංකුර 5-6 පමණ ඇත.

44. බද්ධ අතු තවානක් සඳහා පොහොර යෙදිය යුත්තේ කෙසේද?

වසරකදී දෙවරක් කප්පාදු කිරීම සිදු කරන බැවින් වසරකට අදාල පොහොර ප්‍රමාණයෙන් අඩක් බැගින් කප්පාදු කළ විගස යෙදීම සිදු කෙරේ. පොහොර යොදනුයේ සාමාන්‍යයෙන් වයස අනුව රබර් වගාවකට පොහොර යොදන ආකාරයටමය.





45. ළපටි බද්ධ පැළ, නගන මුල බද්ධ පැළ වලට වඩා ගුණාත්මක භාවයෙන් උසස් වන්නේ ඇයි?

1. මුල පද්ධතිය බාධාවකින් තොරව වර්ධනය වී තිබීම.
2. නිෂ්පාදන කාලය මාස 8 ක් පමණක් වීම.
3. සාපේක්ෂව වියදම අඩු වීම.
4. අවම ශ්‍රමයක් වැය වීම.
5. ක්ෂේත්‍රයේ ස්ථාපිත ප්‍රතිශතය වැඩි වීම.
6. ඒකාකාරී වර්ධනය.

46. හොඳින් වැඩුනු ගුණාත්මක බද්ධ පැළයක අන්තර්ගත විය යුතු ලක්ෂණ කවරේද?

1. මෙම පැළ ළපටි බද්ධ තාක්ෂණය ඔස්සේ නිෂ්පාදනය කල පැළ විය යුතුය.
2. කොළ මාල දෙකෙහි වර්ධන අවධියේ ඇති පැළයක වයස අවුරුද්දකට වඩා අඩු විය යුතුය.
3. කොළ මාල 2 ක් අතර පරතරය අවම වශයෙන් අඩි 1ක් වත් විය යුතු අතර කඳ පොළවට ලම්භකව වර්ධනය විය යුතුය.

47. රබර් ශාකයේ වර්ධක ප්‍රචාරණය සඳහා සාම්ප්‍රදායික බද්ධ කිරීම හැර වෙනත් විකල්ප ප්‍රචාරණ ක්‍රමයක් තිබේද?

නැත. බොහෝ ශාක විශේෂ වලට මේ සඳහා විකල්පයන් ලෙස අතු මුල් ඇද්දවීම, ලේයර් කිරීම හා පටක රෝපණය වැනි ක්‍රම භාවිතා කරන නමුදු, රබර් ශාකය මහා පරිමාණයෙන් ප්‍රචාරණය කර ගැනීම සඳහා මේ එක ද ප්‍රචාරණ ක්‍රමයක්වත් මෙතෙක් සාර්ථක වී නොමැත.

48. ශ්‍රී ලංකාවේ රබර් වගා කරන ප්‍රධාන කන්න දෙක කවරේද?

නිරිත දිග මෝසම හා ඊසාන දිග මෝසම (ආරම්භයත් සමග පැල සිටුවිය යුතුය)

49. හෙක්ටයාරයක වගාකල හැකි රබර් ගස් සංඛ්‍යාව කොපමණද?

ගස් 515 - 520 (වගා කරන ගස් ගණනින් 10% කට සමාන වන පැල ප්‍රමාණයක් ක්ෂේත්‍රයේ පැල අතර සිටුවා පළමු වසර 3 තුල මියයන පැල වෙනුවට සිටුවීමට යොදා ගත යුතුයි).

50. නිර්දේශිත රබර් වගා කිරීමේ පරතර මොනවාද?

භූමියේ බෑවුම් ප්‍රමාණය හා අතුරුභෝග වගා කරන්නේද යන කරුණු මත රඳා පවතිමින්, පහත සඳහන් ක්‍රම අනුගමනය කල හැක.

මීටර් 4.3 x මීටර් 4.5
මීටර් 3.5 x මීටර් 5.5
මීටර් 2.5 x මීටර් 7.75 (අතුරුභෝග සඳහා)
මීටර් 2.4 x මීටර් 12
මීටර් 3 x 3 x මීටර් 18 (ද්විත්ව පේළි ක්‍රමය - තේ සහ කරුඳු වැනි භෝග සඳහා)

51. "ගැඹුරින් පැළ සිටුවීම" (deep planting) යනු කුමක්ද?



බද්ධ සන්ධිය පොළව මට්ටමේ සිට සෙ.මී.10-15 ක් පමණ ගැඹුරින් පිහිටනසේ බද්ධ පැළය සිටුවීම මෙලෙස හැඳින්වේ. පළමු කොළ මාලය දක්වා යට වනසේ සිටුවිය හැකිය

52. එකම වර්ගයේ රබර් ක්ලෝනයක ගස් අතර කිරි අස්වැන්න වෙනස් වීමට බලපාන හේතු කවරේද?

බද්ධ පැළවල මුල් පද්ධතිය බීජ පැළයකින් ලබා ගත් එකක් නිසා, ඒවා එකිනෙකට වෙනස්වීම බද්ධ පැළවල ගුණාංග එකිනෙකට වෙනස්වීමටද හේතුවේ.

53. රබර් ශාකයේ වර්ධන වේගය සහ ඒ මත තීරණය වන වගාවක අපරිනත කාලය කොපමණද?

රබර් ශාකයේ වර්ධන වේගය අවුරුද්දට සෙ.මී.10 ක් පමණ වන අතර, ඒ අනුව රබර් වගාවේ අපරිනත කාලය අවුරුදු 5 ක් පමණ වේ.

54. කිරි කැපීමට සුදුසු ගසක් හඳුනා ගන්නේ කෙසේද?

බද්ධ සන්ධියේ ඉහළම ස්ථානයේ සිට සෙ.මී.120 ක් ඉහළින් වට ප්‍රමාණය සෙ.මී.50ක් වූ ගසක් කිරි කැපීමට සුදුසු ගසක් ලෙස හඳුන්වනු ලැබේ.


>50 cm
120 cm

55. කිරි කැපීමට සුදුසු වගාවක් යනු කුමක්ද?

බද්ධ සන්ධියේ ඉහළම ස්ථානයේ සිට සෙ.මි.120ක් ඉහළින් වට ප්‍රමාණය සෙ.මි.50ක් වූ ගස් 70%ක් වත් ඇති වගාව, කිරි කැපීමට සුදුසු වගාවක් ලෙස නම් කෙරේ.

56. "කිරි කට්ටියක්" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

කිරි කැපුම් කරුවාට දිනකදී කැපීමට වෙන්කර ඇති ගස් ප්‍රමාණය කිරි කට්ටිය ලෙස හඳුන්වයි. එහි හොඳින් කිරි ලැබෙන ගස් 250ත් 300ත් අතර ප්‍රමාණයක් අවම වශයෙන් තිබිය යුතුය.

57. කිරි කැපීමට ආරම්භක උස සෙ.මි.120ක් ලෙස නිර්දේශ කර ඇත්තේ කුමක් නිසාද?

ගසක කිරි කපන්නේ වට භාගයකි. ගසේ වට භාග දෙක කපා නැවත පොත්ත ලියලීමට අවම වශයෙන් අවුරුදු 12ක පමණ කාලයක් ගතවේ. මෙම කාලය පවත්වා ගන්නා අතරම පොත්තේ වැයවීම ගැනද සලකා බලා කිරි කැපීම ආරම්භ කිරීමට සෙ.මි.120 උස නිර්දේශ කර ඇත.

අප රටේ කිරි කපන්නන්ගේ උස අනුව පහසුවෙන් කිරි කැපීමටද මෙම උස උපකාරී වේ.

58. කිරි කැපුමේ බෑවුම 30°ක ආකාරයට ඉහළ වමේ සිට පහළ දකුණට යොදා ඇත්තේ ඇයි?

ගසෙහි කිරි නාල සිරසට 2°-7° ක ආනතියක් සහිතව වාමාවර්තව පිහිටා ඇත. එම නිසා තිරසට 30° ආනතියක් සහිතව ඉහළ වමේ සිට පහළ දකුණට කැපුම යෙදීමෙන් වැඩි කිරි නාල ප්‍රමාණයක් විවෘත වන අතරම, අපතේ යාමකින් තොරව කඳ දිගේ ඒකාකාරව කිරි ගලායාම සඳහාද මෙම ආනතිය උපකාරී වේ.

59. කිරි කැපීමේදී දිනකට වැය වන පොත්තේ ඝණකම සෙ.මී.0.125 ක් ලෙස දක්වා ඇත්තේ කුමක් නිසාද?

කිරි නාලය තුල මිදී ඇති කිරි ප්‍රමාණය ඉවත් කිරීමට මෙම ප්‍රමාණය සෑහෙන අතර, මෙමගින් පොත්ත වැයවීම අවම කළ හැක.

60. එක් එක් පැනලයන් අවුරුදු 6ක් කිරි කැපීමට නිර්දේශ කර ඇත්තේ ඇයි?

නැවත ලියලන ලද පොත්තෙන් හොඳ අස්වැන්නක් ලබා ගැනීමට නම්, වැය වූ පොත්ත නැවත ලියලීමට අවම වශයෙන් අවුරුදු 12 ක කාලයක් ලබා දිය යුතු බැවිනි.

61. දිනක් හැර දිනක් කිරි කපන්නේ ඇයි?

කිරි කැපීමේදී ගසට ඇතිවන විඩාව අවම කර ගැනීමට සහ ගසින් ඉවත් වන පෝෂක කොටස් නැවත නිෂ්පාදනය කර ගැනීමට කාලයක් අවශ්‍යවේ. ඒ නිසා දිනක් හැර දිනක් කිරි කැපීම නිර්දේශ කෙරේ.

62. උදේ පාන්දරින්ම කිරි කැපීමට හේතුව කුමක්ද?

කිරි නාල තුල ඇති පීඩනය උපරිම මට්ටමක පවතින නිසා, කිරි ගලා ඒමේ වේගය පාන්දර කාලයේ වැඩිය. ඒ නිසා ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට නම් උදේ පාන්දරින්ම කිරි කැපීම සිදු කල යුතුය.

63. කිරි කැපුමේ ගැඹුර කැම්බියමේ සිට මි.මි.1 ක් වනසේ පවත්වා ගත යුත්තේ ඇයි?

කැම්බියම ආසන්නයේ වැඩිපුර කිරි නාල පිහිටා තිබේ. ඒ නිසා වැඩිපුර කිරි නාල ප්‍රමාණයක් කපා ගැනීමට කැම්බියම ආසන්නය දක්වාම කිරි කැපිය යුතු අතර කැම්බියමට තුවාල සිදු නොකිරීමට වග බලා ගත යුතුය. කැම්බියම තුවාල උවහොත් ගසෙහි ගැට ඇතිවේ.

64. දිනක් හැර දිනක් කිරි කැපීමේදී දෙවරු කැපීමට මසකට දින 6ක් පමණක් නිර්දේශ කර ඇත්තේ ඇයි?

මෙහිදී කිරි කට්ටි දෙකේම එකම දිනකදී කිරි කැපීම තුලින් දිනපතා එකම ගසෙහි කිරි කැපීමට සිදුවන නිසා, ගසේ ආරක්ෂාව හා කිරිවල නිසි ප්‍රමිතිය ගැන සලකා මසකට දින 6ක් පමණක්, දෙවරු කැපීමට නිර්දේශ කරනු ලැබේ.

65. අපිරිසිදු, තෙත් පොල්කටු වල කිරි මිදෙන හේතුව කුමක්ද?

එබඳු පොල්කටු වල බැක්ටීරියා වර්ධනය වී, එමගින් නිපදවන අම්ල නිසා මෙලෙස කිරි මිදීම සිදු වේ.

66. කදේ ඉහළ කිරි කැපුම් සඳහා 45°ක ආනතියක් භාවිතා කරන්නේ කුමක් නිසාද?

මෙහිදී කැපුම ඇත්තේ පහළට මුහුණ ලා වන අතර, අඩු ආනතියකදී ගස දිගේ කිරි බේරී අපතේ යෑමට ඉඩ ඇති බැවින් එය වැළැක්වීමට 45° ක ආනතියක් නිර්දේශ කෙරේ.

67. කිරි කැපීම ආරම්භ කර කාලයක් ගත වීමේදී සමහර ගස් වියළීම සිදු වන්නේ කුමක් නිසාද?

රබර් ගස් වල නිර්දේශිත තීව්‍රතාවයට වඩා වැඩිපුර කිරි කැපීම තුලින් ගසකට ලබා දීමට හැකි ප්‍රමාණයට වඩා වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගැනීම නිසා. මිට අමතරව, කායික විකෘතිතා, ක්ෂේත්‍රයෙහි ජලය රඳාපැවතීම, දුර්වල කෘෂි පාලන කටයුතු හා දිලීර ආසාදන බලපායි.

68. කිරි කැපිමේ අවසාන වසර 6 ආරම්භයේදී තීව්‍රතාකරණය හඳුන්වා දීමට හේතුව කුමක්ද?

මේ වනවිට වගාවෙන් ලැබෙන කිරි අස්වැන්නේ ප්‍රමාණය අඩුවන නිසා එය ආර්ථික වශයෙන් ඵලදායි නොවේ. එම අස්වැන්නේ අඩුව පියවා ගැනීමට තීව්‍රතාකරණය නිර්දේශ කෙරේ. අස්වැන්න අඩු වන විට මෙය ආරම්භ කල යුතු අතර, එය ක්‍රමාණුකූලව සිදු කල යුතුය.

69. රබර් කිරි කැපිමේ තීව්‍රතාකරණ පිළිවෙල කුමක්ද?

19 → 21 වන අවුරුදු (තීව්‍රතාකරණයේ පළමු අවුරුදු 3)
1/2S d2 ↓ + 1/4S d2↑
ගසින් වට භාගයක් පහළට හා වට 1/4ක් ඉහළට දින දෙකකට වරක්.

22 වන සහ 23 වන අවුරුදු (තීව්‍රතකරණයේ 4 වන හා 5 වන අවුරුදු)
2 x 1/2 d2 ↓↑

ගසේ වට භාගයක් ඉහළට හා භාගයක් පහළට දින දෙකකට වරක්.

24 වන අවුරුද්ද (තීව්‍රතාකරණයේ අවසාන වසර)
4 x 1/2S d2 ↓↑

ගසෙහි වට භාග දෙකක් පහළට හා භාග දෙකක් ඉහළට දින දෙකකට වරක්.

70. කිරි කැපීමට භාවිතා කරන පිහිය මුවහත් වාගේ පිහියක් විය යුත්තේ ඇයි?

දිනකට කිරි කැපුම් කරුවකු ගස් 300ක් පමණ කැපිය යුතු අතර, කැපුමේ ගැඹුර, ඉවත් කරන පොත්තේ ඝණකම සහ කැපුමේ බෑවුම නිසියාකාරව පවත්වා ගැනීමට මෙවැනි පිහියක් අවශ්‍ය වේ. මුවහත් අඩු පිහියකින් කැපුවහොත් කිරි නාල විවරවීම නිසි ලෙස සිදු නොවන අතර, අස්වැන්න අඩුවීමට එය හේතු වේ. මුවහත්භාවය පවත්වා ගැනීමට එය කාබන් ප්‍රතිශතය වැඩි වාගේ පිහියක් විය යුතුය.

71. පාලනයක් සහිතව උඩු අතට කිරි කැපීමේ ක්‍රමය (CUT) හඳුන්වා දීමට හේතුව කුමක්ද?

පළමු මව් පැනල දෙක හා නැවත ලියලූ පොත්තේ පළමු පැනලය නිර්දේශිත කාලයට පෙර වැය වුවහොත්, අවසාන කැපුමෙහි පොත්ත ලියලීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබාදීමටද, රබර් ගස් වැඩි කාලයක් තබා ගනිමින් නැවත වගා කිරීම ප්‍රමාද කිරීමටද මෙය යොදා ගත හැක.

72. රබර් වගාවේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා සුලභව භාවිතා කරන උත්තේජකය කුමක්ද?

එතෆෝන් (2-ක්ලෝරෝ ඊතයිල්ෆොස්ෆනික් අම්ලය).

73. අස්වැන්න වැඩි කිරීම සඳහා එතෆෝන් මගින් රබර් ගස උත්තේජනය කරන්නේ කෙසේද?

- එතෆෝන් ජලය සමග ප්‍රතික්‍රියා කර එතිලින් වායුව නිදහස් කරයි.
- එතිලින් මගින් ශාකයේ ඇති සංචිත කාබෝහයිඩ්‍රේට් (පිෂ්ඨය) සීනි (සුක්‍රෝස්) බවට පත් කර ශාකය තුල රබර් (පොලිඅයිසෝප්‍රීන්) නිෂ්පාදනය වැඩි කරයි.
- එතිලීන් කිරිනාල තුල ශූනතා පීඩනය වැඩි කර වෑස්සෙන කිරි ප්‍රමාණය වැඩි කරයි.
- දෙවනුව එමගින් කිරි නාල තුල අවහිර වීම (Plugging) පමා කිරීමෙන් කිරි වෑස්සෙන කාලය දිගු කරයි.

74. CUT හෙවත් Control Upward Tapping සඳහා නිර්දේශිත උත්තේජන ක්‍රමය කුමක්ද?

5% සාන්ද්‍රණයෙන් යුත් එතෆෝන් සෑම මසකම ආලේප කළ යුතු වේ.

75. උත්තේජන ආලේප කොට දින 3 කට වරක් කිරි කැපීමේ ක්‍රමය හඳුන්වා දී ඇත්තේ ඇයි?

කිරි කැපුම් කරුවන්ගේ හිඟය මැඩලීම සඳහාත්, පොත්ත වැයවීම හා කිරි කැපීම සඳහා වැය වන වියදම අඩු කිරීම සඳහාත් දින 3කට වරක් කිරි කැපීම සිදු කරයි. මෙම ක්‍රමයේදී දින දෙකකට වරක් කිරි කැපීමේදී ලබාගන්නා අස්වැන්නට සමාන අස්වැන්නක් ලබා ගැනීම සඳහා (ශාකයේ විභව අස්වැන්න ලබා ගැනීම සඳහා) එතෆෝන් උත්තේජනය හඳුන්වා දී ඇත.

76. මව් පොත්තේ එතෆෝන් ආලේප කිරීමේදි 2.5%ක සාන්ද්‍රණයකින් යුත් එතරල් ආලේප කරන්නේ කුමක් නිසාද?

මෙම සාන්ද්‍රණය භාවිතා කිරීමෙන් ගසට ඔරොත්තු දිය හැකි ප්‍රමාණයට වඩා වැඩියෙන් අස්වැන්න ලබා නොගෙන, ගසට ලබා දිය හැකි කිරි ප්‍රමාණය පමණක් ලබා ගත හැකි වීම නිසා.

77. දින 3කට වරක් කිරි කැපීමේදී උත්තේජන ආලේප කළ යුතු තීව්‍රතාවය කුමක්ද?

2.5% සාන්ද්‍රනය සහිත එතෆෝන්, කැපුමට ඉහළින් සෙ.මී.2.5 ක් පළල පටියක් ලෙසට වසරකට 4-5 වතාවක් ආලේප කල යුතුය.

78. අළුත් රබර් වගාවක, පොත්ත වියළීමේ රෝගය අවම කර ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග කවරේද?

1. නොගැඹුරු පසේ හෝ ජලය වැඩිපුර රඳන ස්ථානවල පැළ සිටුවීම නොකළ යුතුය.
2. උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය පමණක් වගාව සඳහා යොදා ගත යුතුය.
3. පොහොර යෙදීම වැනි කෘෂි පාලන කටයුතු වඩාත් හොඳින් සිදු කළ යුතුය.
4. කිරි කැපීමේ නිර්දේශිත ක්‍රම පමණක් අනුගමනය කළ යුතුය.

79. පොත්ත වියළීමට භාජනය වූ ගස් සඳහා අනුගමනය කළ යුතු කිරි කැපුම් ක්‍රමය කුමක්ද?

ගස් මාස 6 ක් විවේක ගැන්වීමෙන් අනතුරුව, නැවත එම පැනලය විවෘත කරන්න. තව දුරටත් එම පොත්ත වියළි තත්වයේ පවතී නම්, එම වියළි පැනලයට විරුද්ධ පැත්තේ වට කාලක (1/4) උඩු කැපුමක් ආරම්භ කොට කිරි කැපීම සිදු කරන්න.

මෙම ගස් කිසි විටෙක උත්තේජනය නොකළ යුතු අතර, ඒවායේ දෙවරු කැපීම් සිදු නොකළ යුතුය.

80. වැහි ආවරණ භාවිත කිරීමේ ප්‍රධාන අරමුණ කුමක්ද?

වර්ෂාව නිසා කිරි කැපීමට නොහැකි වන දින ගණන අවම කර ගැනීමට මෙසේ සිදු කරනු ලැබේ.

81. වැහි ආවරණ භාවිත කිරීමේ වෙනත් ප්‍රයෝජන මොනවාද?

1. දෙවරු (හානි පූර්ණ) කැපීමෙකින් තොරව, නිර්දේශිත කැපුම් තිව්‍රතාවයට අනුව කිරි කැපීමට හැකිවීම.
2. ඒ අනුව රබර් වවන්නන්ගේ හා කිරි කැපුම්කරුවන්ගේ ආදායම සුරක්ෂිත වීම.
3. කාර්යක්ෂම ලෙස උත්තේජන භාවිතා කල හැකි වීම.

82. වැහි ආවරණයක එලදායි ආයු කාලය කොපමණද?

අවුරුද්දක්.

83. රබර් ආශ්‍රිත මිශ්‍ර බෝග වගා කිරීම යනු කුමක්ද?

රබර් සමග වෙනත් බෝගයක් හෝ බෝග කිහිපයක් එකම භූමියේ වගා කිරීම හෝ සතුන් ඇති කිරීම වේ.

84. රබර් වගාවේ නිෂ්පාදනයක් නොමැති අපරිණත අවධියේදී ආදායමක් ලබා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගය කුමක්ද?

සුදුසු අතුරුබෝග වගාවක් යෙදීම.

85. රබර් වගාවේ අපරිණත කාලය තුල අතුරුබෝග වගා කිරීමට අදහස් කරයි නම්, රබර් සිටුවීමට නිර්දේශිත පරතරය කුමක්ද?

පැළ අතර පරතරය මීටර් 2.5 හා පේළි අතර පරතරය මීටර් 7.75. තවද මීටර් 3 × 3 × 18 යෙදීමෙන් තේ, කුරුඳු වැනි භෝග වගා කල හැකිය.

86. හෙක්ටයාරයකට නිර්දේශිත රබර් පැළ ප්‍රමාණය අඩු කිරීමකින් තොරව දිගුකාලීනව වගා කළ හැකි අතුරු භෝග මොනවාද?

කෝපි සහ කොකෝවා.

87. හෙක්ටයාරයකට නිර්දේශිත රබර් පැළ ප්‍රමාණය අඩු කිරීමට සිදුවන අතුරු බෝග වගාවන් මොනවාද?

දිගු කාලීන අතුරු බෝග වන තේ, කුරුඳු වැනි බෝග.

88. අතුරු බෝග ලෙස කරඳමුංගු, වැනිලා හා වේවැල් වගා කිරීමට පරිණත රබර් වගාවක් තෝරා ගත යුත්තේ ඇයි?

ඉහත සඳහන් බෝග හොඳින් ස්ථාපනය සහ වර්ධනය සඳහා සෙවණ අවශ්‍ය බැවින්.

89. රබර් ගසේ ප්‍රශස්ථ වර්ධනය සඳහා අතුරු බෝගය සහ රබර් ශාකය අතර තිබිය යුතු සාමාන්‍ය පරතරය වන්නේ කුමක්ද?

රබර් ශාකයේ සිට අතුරු බෝග ශාකය අතර අඩි 8ක (මී.2.5) පමණ දුරක්.

90. රබර් සමග අතුරු බෝග වගා කරන විටදී පොහොර යෙදිය යුතු ක්‍රමය කුමක්ද?

රබර් සහ අතුරුබෝග සඳහා නිර්දේශිත සම්පූර්ණ පොහොර ප්‍රමාණය යෙදිය යුතුය.

91. මැහෝගනී, හවරි නුග, කොස් ආදී දැවමය බෝග රබර් ඉඩම්වල වගා කළ හැකිද?

මෙම බෝග රබර් සමග තරගකාරී බැවින්, වඩාත් සුදුසු වන්නේ ඒවා රබර් ඉඩම්වල මායිම්වල වගා කිරීමයි. දැවමය අතුරුබෝග ශාක අතර මි.4.5 ක පරතරයක් පවත්වා ගත යුතුය.

92. රබර් සමග වගා කිරීමට සුදුසු අතුරු බෝග අතරින් ඔබ තෝරා ගත යුත්තේ කුමක්ද?

ඔබ ප්‍රදේශයේ ඉතා හොඳින් වැඩෙන, ප්‍රදේශයේ කාලගුණික තත්වයන්ට සුදුසු, හොඳ වෙළඳ පොළක් සහිත බෝගයක් තෝරා ගැනීම වඩාත් උචිතය.

93. මිටර් 2.5 x මිටර් 7.75 පරතරයට රබර් සිටුවීමෙන් ලැබෙන ප්‍රයෝජන කුමක්ද?

- අතුරුබෝග වගා කිරීමට හැකි වීම.
- පාංශු සංරක්ෂණ කටයුතු පහසුවෙන් සිදු කල හැකි වීම.
- කිරි කැපුම්කරුවකුට ගසින් ගසට ඇවිද යාමට සිදුවන දුර ප්‍රමාණය, සහ ඒ සඳහා ගතවන කාලය අඩු වීම.

94. රබර්/තේ අතුරුබෝග වගාවේදී හෙක්ටයාර 1.5 ට අඩු ඉඩම් සඳහා සුදුසු පැළ සිටුවීමේ පරතරය කුමක්ද?

2.4 මීටර් x 12 මීටර්

95. හෙක්ටයාර 1.5 ට වැඩි ඉඩමක රබර්/තේ අතුරු බෝග සඳහා සුදුසු පරතරය කුමක්ද?

(3 x 3 මීටර්) x 18 මීටර් - රබර් ද්විත්ව පේළි ක්‍රමය

96. පරිණත රබර් වගාවක අතුරුබෝගයක් ලෙස වගා කළ හැකි මල් වර්ගයක් නම් කරන්න?

ඇන්තූරියම්

97. රබර් වගාවේ ඕනෑම අවධියකදි සත්ව පාලනය සඳහා සුදුසු සත්ත්ව වර්ගයක් නම් කරන්න.

කුකුල් පාලනය

98. සාමාන්‍ය තත්ත්ව යටතේ ක්ෂේත්‍රයේ ඇති රබර් ශාකයක් තම අවුරුදු 30 ක ජීවිත කාලය තුල තිර කරනු ලබන කාබන් ප්‍රමාණය කොපමණද?

කිලෝ ග්‍රෑම් 250 පමණ.

99. පත්‍ර වැටීමෙන් පසු රබර් ගස්වල කන්ඩාර්සන් ආලේප කිරීම කොතෙක් දුරට වැදගත්ද?

මෙය අවශ්‍ය නොවේ. කන්ඩාර්සන් යනු දිලීර නාශකයක් නොවේ. එය ආරක්ෂක ස්ථරයක් පමණි. කැපුම් කට්ටයේ දිලීර නාශක ආලේප කළ යුත්තේ නිරිතදිග මෝසම් වැසි කාලයේ හට ගන්නා පයිටොප්තෝරා පොතු කුණුවීමේ රෝගය සඳහා ය. ඒ සඳහා බෘනෝලිනම්/රිඩොමිල් වැනි දිලීර නාශකයක් භාවිත කළ හැක. පොත්තේ තුවාලයක් සෑදුනු විට දිලීර නාශකයක් යොදා එය සේදීයාම වැළැක්වීමට කන්ඩාර්සන් ඊට උඩින් ආලේප කළ හැක.

100. රබර් තවානකට දිලීර නාශක භාවිත කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද?

- උදේ 6.30 ත් 10.30ත් අතර යෙදිය යුතුය
- වැස්ස හා අධික හිරු රශ්මිය නැති විය යුතුය
- බෙහෙත් ඉසින්නා හොඳින් ශරීරය ආවරණය කරගත යුතු අතර මුව, අත් හා හිස් ආවරණ පැළඳිය යුතුය.

- බෙහෙත් ඉසින අතරතුරදී බුලත් විට හෝ දුම්පානය නොකළ යුතුය.
- තද සුළං ඇති විට රසායන ද්‍රව්‍ය ඉසීමෙන් වැලකිය යුතුය.

101. වර්තමානයේ රබර් වගාවන්හි කම්බිලි පණුවන් ආක්‍රමණය වැඩිවීමට බලපාන හේතු සාධක මොනවාද?

- රබර් නව වගාවක් කිරීම සඳහා සුදුසු සැලැස්මක් නොමැති වීම. එනම් කැලෑ සහිත බිම් එළි පෙහෙළි කිරීම ආදී කටයුතු සඳහා ප්‍රමාණවත් කාලයක් හා මුදල් වෙන් නොකිරීම.
- කපා ඉවත් කෙරන ලද වල් ගස් නිසි පරිදි ක්ෂේත්‍රයෙන් ඉවත් නොකිරීම. එමගින් එම මුල් කැබලි අතු හා කඳන් ක්ෂේත්‍රයේ ඉතිරි වී තිබියදීම රබර් පැළ සිටුවීමට කටයුතු කිරීම.
- රසායනික පොහොරවලට අමතරව හරි හැටි ජීරණ නොවූ කාබණික පොහොර, පැළවලට හා පැළ සිටුවන වල වල් වලට එකතු කිරීම. එමගින් කම්බිලි පණුවාගේ ජීවන චක්‍රයේ අවස්ථා පහසුවෙන් සම්පූර්ණ කර ගත හැකිවීම.

102. පත්‍ර හැකිළීම සහ කහ වීමට බලපාන හේතු සාධක මොනවාද?

- සුදුමුල් රෝගය හෝ වෙනත් මුල් රෝගයක් පැවතීම.
- දුර්වල ජල වහනය/ජලය රඳා පැවතීම.

- යාන්ත්‍රික හේතු නිසා කඳේ පොතු වටයක් ඉවත්වීම.
- කෘන්තකයන් (ඉත්තෑවන්, ඌරන්) හානි කිරීම නිසා පොතු වටයක් ඉවත්වීම.
- කම්බිලි පණුවන් හානි කිරීම.
- ගල් සහිත පොළොවෙහි පැළ සිටුවීම.

103. පැච් කැන්කර් රෝගය සඳහා නිර්දේශිත දිලීර නාශකය කුමක්ද?

ඩයිතේන් එම් 45 (මැන්කොසෙබ්)
(ග්‍රෑම් 5 ක් ජලය ලීටරයක දියකර යෙදිය හැකිය).

104. මෝසම් වැසි සමයේදී කැපුම් කට්ටය රෝගවලින් ආරක්ෂා කර ගන්නේ කෙසේද?

පහත සඳහන් දිලීර නාශක වලින් එකක්, සෑම කිරි කැපූ දිනකම, කිරි එකතු කිරීමෙන් පසුව කැපුම් කට්ටයේ ආලේප කරන්න. (A සහ B පැනලයේ)

බෲනෝලියම් පැල්න්ටාරියම් 15%
හෝ
රිඩොමිල් ග්‍රෑම් 5/ලීටරයට.



105. පයිටොප්තෝරා පොතු කුණුවීමේ ආසාදනය වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග මොනවාද?

- නිරිතදිග මෝසම් වැසි සමයේදී අලුතින් කැපුම් කට්ට යෙදීම හෝ කැපුම් කට්ටය මාරු කිරීමෙන් වැළකීම.
- පත්‍ර මත ආසාදනය පවතින විට, වැසි දිනවලදී කිරි කැපීමෙන් වැළකීම.
- වර්ෂා කාලයට පෙර කඳන් මත ඇති දිය සෙවෙල හැකි තරම් ඉවත් කිරීම.
- අනවශ්‍ය අතු ඉවත් කිරීම මගින් හොඳින් වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම.
- ශාකය අවට වල් පැළ මර්ධනය කිරීම.
- වැසි ආවරණ නිසි ලෙස යෙදීම.

106. පයිටොප්තෝරා පොතු කුණු වීමේ රෝගය සෑදුණු ශාකයකට ලබාදිය යුතු ප්‍රතිකර්මය කුමක්ද?

ආසාදිත පොත්ත ඉතා ප්‍රවේශමෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න. ඉතිරිවන තුවාලය, ඉතා සියුම් දාර සහිතව ජලය හොඳින් බැස යන සේ තිබිය යුතුය.

බෘනොලිනම් ප්ලැන්ටාරියම් (15%) හෝ රිඩොමිල් (ග්‍රෑම් 5 ක් ජලය ලිටරයක) යන දිලීර නාශකවලින් එකක් තුවාලය මත ආලේප කොට එය සේදීයාම වැළැක්වීමට කන්ඩාසන් වැනි ආලේපයක් යෙදිය හැක.

107. පැළ තවානක් පවත්වා ගෙන යාමේදී පිළිපැදිය යුතු නිර්දේශිත හා නිවැරදි වගා ක්‍රමවේදයන් මොනවාද?

- රබර් බීජ තවාන් ස්ථාපනය කිරීමේදී මතුපිට පස් යෙදීම වෙනුවට ගංගා වැලි භාවිතා කිරීමෙන් බීජ පැළවල පාදස්ථ හා බීජාංකුර කුණුවීමේ රෝගය මර්ධනය කර ගත හැකිය.
- රබර් බීජ තවාන් ස්ථාපනය කිරීමේදී දිරායන ශාක කොටස් හා කාබනික ද්‍රව්‍ය වලින් තොර විය යුතුය. එමගින් සුදුමුල් රෝගය හා පීයොට්‍රිකම් යන රෝග සෑදීම වළක්වා ගත හැකිය.
- බීජ පැළ තවාන් හා පොලිතීන් මලු තවාන්වල පැළ අතර දුර ප්‍රමාණය සුදුසු පරිදි තැබීමෙන් ඕයිඩියම්, පයිටොප්තෝරා, කොරිනස්පෝරා සහ ග්ලියොස්පෝරියම් යන පත්‍ර රෝග පාලනය කර ගත හැකිය.
- ක්‍රමානුකූල වල් පැළෑටි මර්ධනය මගින් පැළ අග්‍රස්ථයේ සිට පහළට මිය යාම හා පත්‍රවල තැනටපෝරස් ආසාදනය වළක්වා ගත හැකිය.
- නියමිත වේලාවට වියළි කාලගුණ තත්වයන්හිදී වතුර යෙදීම මගින් පාදස්ථයේ තුවාල වීම හා හදිසියේ ශාකය මැලවීයාම වළක්වා ගත හැකිය.
- තවාන් ස්ථාපිත කිරීමේදී සුදුසු ප්‍රදේශයක් තෝරා ගැනීම (උදා: පරිණත වගාවන්ගෙන් ඈත්ව) ඕයිඩියම්, පයිටොප්තෝරා, ග්ලියොස්පෝරියම් සහ කොරිනස්පෝරා රෝග පාලනය කර ගත හැකිය.

- රබර් පර්යේෂණායතනයේ අනුමත දිලීර නාශක රෝග ඇතිවීමට පෙර යොදා, රෝග වලින් ආරක්ෂා කර ගත යුතුය.

108. රබර් ගසක කිරි පට්ටයෙන් නොනැවතී කිරි ගලන අතර එම පට්ටය අවට ප්‍රදේශයේ පිපිරීම් ඇතිවී ඒවායේ ඇතුළත කිරි කැටි ගැසීමේ තත්වයක් ඇති වන්නේ ඇයි?

මෙය පයිටොප්තෝරා නමැති දිලීරය ආසාදනය වූ විට ඇතිවන ලක්ෂණයකි. මෙය මගහරවා ගැනීමට ආසාදිත ගස්වල කිරි කැපීම නවතා දැමිය යුතු අතර කැපුම් කට්ටයේ සුදුසු දිලීර නාශකයක් ආලේප කළ යුතු වේ. තවද පොත්ත ඇතුලත කිරි ගැලීම් ඇති ස්ථාන පිරිසිදු කර එම ප්‍රදේශය මත දිලීර නාශක යොදා වතුරෙන් සේදීයාම වැළැක්වීම සඳහා කන්ඩාසන් වැනි බෙහෙතක් ගැල්විය යුතු වේ.

109. පැළ රබර් වගාවක් මයිටාවන් ආසාදනය පාලනය කර ගන්නේ කෙසේද?

ස්වාභාවික සතුරන් (ලේඩි බර්ඩ් බීටල් හා මකුළුවන්) මගින් ඉබේම පාලනය වේ. එහෙත් දරුණු ආසාදනයකදී සල්ෆර් අඩංගු දිලීර නාශකයක් යෙදිය හැකිය.

110. කම්බිලි පණුවන් මර්ධනය සඳහා යොදා ගත හැකි පාලන ක්‍රම මොනවාද?

1. පැළය සිටුවන වලට කාබනික ද්‍රව්‍ය යෙදීම නොකළ යුතු අතර, කුරුමිණියන් බෝවීම අඩු කිරීම සඳහා වගා ක්ෂේත්‍රය ශුද්ධ කොට තබා ගත යුතුය.
2. ක්ෂණික ප්‍රතිකාරයන් ලෙස ඩික්ලෝරොයිරිෆෝස් 40 EC කෘමිනාශකය යෙදිය හැක. කම්බිලි පණුවන්ගේ බලපෑම බොහෝ කලක් තිස්සේ පවතී නම්, සුහුඹුල් කුරුමිණියන් ආකර්ෂණය කර ගැනීම සඳහා උගුල් ඇටවිය යුතුය.

111. පරිණත රබර් වගාවකට පොහොර යෙදීමට සුදුසුම කාලය කුමක්ද?

කොළ හැලී නැවත දළු ලෑමෙන් පසු මාසයක් ඇතුළත

112. වගාවක තිබෙන නියමිත වට ප්‍රමාණයට වඩා අඩු පැළ, වැඩිපුර පොහොර යෙදීමෙන් යථා තත්වයට පත් කරගත හැකිද?

මේ සඳහා කරුණු රාශියක් බලපෑ හැකි බැවින් එසේ වීමට හේතුව සොයා ඊට නිසි පිළියම් යෙදිය යුතුය.

113. ආනයනික රොක් පොස්පේට් (IRP) වෙළඳ පොලෙහි නැති අවස්ථාවක ඒ සඳහා යොදා ගත හැකි විකල්ප පොහොර වර්ගයක් තිබේද?

ඔව්, අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP)

114. 12 : 14 : 14 නම් වූ මිශ්‍රණය සාදා ගන්නා ආකාරය පහදා දෙන්න?

එම මිශ්‍රණයෙන් කිලෝ 100ක් සාදා ගැනීමට යූරියා කිලෝ 26 ක්ද මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) කිලෝ 24 ක්ද රොක් පොස්පේට් කිලෝ 50 ක්ද හොඳින් මිශ්‍ර කර ගන්න.

115. පොහොර යෙදීමට සුදුසුම ක්‍රමය කුමක්ද?

ගස වටේට වල් මර්ධනය කර, ස්ථාන තුන හතරක් අඟල් 6 - 9 ගැඹුරට මුල්ලු කර, එම සිදුරු තුලට පොහොර යොදා පස් වලින් වැසීම, ගසේ සිට දුර අඩි 1 සිට 3-4 දක්වා, ගසේ වයසත් සමග වැඩි කළ යුතුය.

116. 12 : 14 : 14 මිශ්‍රණය සමග කීසරයිට් මිශ්‍ර කර ගසට යෙදිය හැකිද?

ඔව්, නමුත් එම මිශ්‍රණය කල් තබා ගත නොහැකිය.

117. **පරිණත වගාවකට ඩොලමයිට් යෙදීම නිර්දේශ කෙරේ ද?**

නැත. ඒ වෙනුවට කීසරයිට් භාවිතා කළ යුතුය.

118. **පරිණත වගාවකට පොහොර යෙදිය යුතුද?**

ඔව්, කිරි කපන පළමු වසරේ සිට වසර 18ක් යන තෙක් පොහොර යෙදිය යුතුය. මෙම කාලය තුල (N) හා (K) අඩංගු පොහොර යෙදීම අත්‍යාවශ්‍යය.

119. **ළපටි බද්ධ තවානකට කැට පොහොර යෙදීම නිර්දේශ කෙරේද?**

නැත. සම්පූර්ණයෙන්ම ජලයේ දියවන, නිර්දේශිත මිශ්‍රණ පමණක් යෙදිය යුතුය.

120. **රබර් වගාව සඳහා සුදුසුම ආවරණ වගාව කුමක්ද? එය බෝ කරගන්නේ කෙසේද?**

***මුකුණා බ්‍රැක්ටියාටා,* මෙම දඬු කැබලි පොලිතීන් මලුවල සිටුවා පැළ කර ගැනීම මගින්.**

121 රබර් සඳහා සුදුසු ආවරණ වගා මොනවාද?

1. *මුකුනා බ්‍රැක්ටියාටා*
2. *පියුරේරියා ෆැසියොලොයිඩ්ස්*
3. *ඩෙස්මෝඩියම් ඔවලිෆෝලියුම්*
4. *කැලපගෝනියම් මුකුනොයිඩ්ස්*
5. *සෙන්ට්‍රොසීමා පියුබසන්ස්*

122. බෑවුම් සහිත බිමක පස සෝදායාම වළක්වා ගැනීමට කළ යුත්තේ කුමක්ද?

ප්‍රධාන වශයෙන් කාණු දැමීම, ගල්වැටි දැමීම හා හොඳ ආවරණ වැල් වගාවක් පවත්වා ගෙන යාම

123. ළපටි බද්ධ තවාන්වලට යොදන ඩයි ඇමෝනියම් පොස්පේට්වලට විකල්ප පොහොරක් තිබේද?

තවම නැත.

124. පසේ සාරවත් භාවය වැඩිකර පවත්වා ගැනීමට අපට කළ හැකි දේ මොනවාද?

1. සිටුවන වලවල් තුලට කාබනික පොහොර කිලෝ 2ක් 3ක් පමණ යෙදීම
2. රබර් ගස වටා පිදුරු, වෙනත් ඕනෑම කොළ පොහොරක්, කුකුල් පොහොර, ගොම පොහොර හෝ කොම්පෝස්ට්, ගසේ වයස අනුව කිලෝ 2 සිට 5ක් පමණ වසරකට යෙදීම.

125. රබර් ගස වටා වල් මර්ධනය කිරීමට යොදාගත හැකි ක්‍රම මොනවාද?

ගස වටා වසුන් භාවිතය, විශේෂිත "පවර් මැට්" භාවිතය, රවුන්ඩ් අප් සහ ඩයියුරේන් මිශ්‍රණය යෙදීම හෝ උදලු ගෑම.

126. අපරිණත කාලයේදී වසරකට නිර්දේශිත ඩොලමයිට් ප්‍රමාණය යෙදි යුතු වාර ගණන කොපමණද?

එක් වාරයකින් යෙදිය යුතුය.

127. DPNR යනු කුමක්ද?

නිර්ප්‍රෝටීන ස්වභාවික රබර්.

128 ශ්‍රී ලංකාවේ වාණිජව DPNR නිෂ්පාදනයේදී භාවිතා කරන්නේ කුමක්ද?

පැපේන්.

129. ක්ෂේත්‍රයේදී රබර් කිරි වල වියළි රබර් ප්‍රතිශතය නිර්ණය කරන්නේ කෙසේද?

මෙට්‍රෝලැක් උපකරණය භාවිතයෙන් (මෙය විශේෂිත ද්‍රවමාණයකි).

130. රබර් කිරි වල තිබෙන වාණිජමය වටිනා කමකින් යුත් කාබෝහයිඩ්‍රේට් වර්ගය කුමක්ද?

කියුබ්‍රැකිටොල් (Quebrachitol)

සම්පත් දායකයින්

ප්‍රවේණි සහ ශාක අභිජනන දෙපාර්තමේන්තුව

කේ.කේ. ලියනගේ, Bsc Agric (ලංකා), Mphil (ලංකා)	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
කේ.බී.ඒ. කරුණාසේකර	සංවර්ධන නිලධාරී
කේ.ඩබ්. රූපතුංග	අත්හදා බැලීමේ නිලධාරී
අයි.ඩී.එම්.ජේ. සරත් කුමාර	අත්හදා බැලීමේ නිලධාරී
එල්.එස්. කාරියවසම්	අත්හදා බැලීමේ නිලධාරී
එම්.එස්.කේ. ගුණසේකර	අත්හදා බැලීමේ නිලධාරී
එච්.පී. පීරිස්, Dip in Agric (කුණ්ඩසාලේ)	අත්හදා බැලීමේ නිලධාරී
ඒ.එස්. ගමගේ මිය, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී

ශාක විද්‍යා දෙපාර්තමේන්තුව

පී.පී.ඩබ්.පී.පී. සෙනෙවිරත්න මිය, BSc (ලංකා), PhD (බාත්)	දෙපාර්තමේන්තු ප්‍රධානී
ඒ.එම්.ඩබ්.කේ. සෙනෙවිරත්න, BSc (ලංකා), MSc (ලංකා), PhD (වේල්ස්)	උද්භිද විද්‍යාඥ
එන්.එම්.සී. නයනකාන්ත, BSc (ලංකා), MSc (ඉන්දියා)	උද්භිද විද්‍යාඥ
ඩී.එස්.ඒ. නාකන්දල මිය, BSc Agric (ලංකා)	සහකාර උද්භිද විද්‍යාඥ

කේ.ඒ.පී.බී. අමරතුංග	සහකාර උද්භිද විද්‍යාඥ
ටී.යු.කේ. සිල්වා, BSc (Agric) (ලංකා)	සහකාර උද්භිද විද්‍යාඥ
ආර්.පී. කරුණාසේන	අත්හදා බැලීමේ නිලධාරී
පී.ඒ.එස්. විජේසේකර මිය	අත්හදා බැලීමේ නිලධාරී
ආර්.කේ. සමරසේකර මිය	අත්හදා බැලීමේ නිලධාරී
ඩබ්.ඩී.එම්.එන්. ද අල්විස්, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
එම්.කේ.පී. පෙරේරා, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
ඩී.එල්.එන්.ද සොයිසා	අත්හදා බැලීමේ නිලධාරී
පී.ඩී. පතිරන, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
පී.කේ.ඩබ්. කරුණාතිලක, Dip in Agric	අත්හදා බැලීමේ නිලධාරී

ශාක ව්‍යාධි විද්‍යා සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව

ඩබ්.පී.කේ. සිල්වා මෙනෙවිය, BSc (ලංකා) MSc (ලංකා), Mphil (ඔස්ට්‍රේලියා), පීඑච්ඩී (ලංකා)	දෙපාර්තමේන්තු ප්‍රධානි
එච්.පී.එස්. ප්‍රනාන්දු මිය, BSc (ලංකා), Mphil (ලංකා)	සහකාර ව්‍යාධි විද්‍යාඥ
බී.අයි. තෙන්නකෝන් මිය, Dip. in Agric. (කුණ්ඩසාලේ)	අත්හදා බැලීමේ නිලධාරී
ඊ.ඒ.ඩී.ඩී. සිරිවර්ධන මිය, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
එස්.සී.පී. විජේරත්න, NDT (Agric) (හාඩි)	අත්හදා බැලීමේ නිලධාරී

එන්. ජයවර්ධන මිය, Dip in Agric. (බිබිල)	අත්හදා බැලීමේ නිලධාරී
එස්.ආර්.ඩී.පී. පීරිස්, BSC (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
ඊ.ඒ.ඩී.එන්. නිශාන්ත, Dip in Agric (රත්නපුර)	අත්හදා බැලීමේ නිලධාරී

පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව

එම්.එල්.ඒ. සමරප්පුලි මිය, BSc (Agric) (ලංකා), MSc (කැලිෆෝනියා), PhD (ලංකා)	දෙපාර්තමේන්තු ප්‍රධානි
ආර්.එස්. ධර්මකීර්ති, BSc (Agric) (ලංකා), MSc (ලංකා), PhD (කැනඩා)	පාංශු රසායනඥ
ආර්.පී. හෙට්ටිආරච්චි මිය, BSc (ලංකා), MPhil (ලංකා)	සහකාර පාංශු රසායනඥ
එච්.ඩී.එස්.පී. පෙරේරා, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
එස්.ඩී.සී.කේ. මහීපාල මිය	අත්හදා බැලීමේ නිලධාරී
එස්.එන්. සිල්වා	අත්හදා බැලීමේ නිලධාරී
පී. කරුණාදාස, BSc (ලංකා), MSc (ලංකා), MiBiol (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
ඒ.එච්.යු. මිත්‍රසේන	අත්හදා බැලීමේ නිලධාරී
ඒ.එන්. යකන්දාවල	අත්හදා බැලීමේ නිලධාරී
ටී.බී. දිසානායක	අත්හදා බැලීමේ නිලධාරී
ඩී.යු. එදිරිමාන්න මෙනෙවිය, BSc (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
ඒ.පී. තෙවරප්පෙරුම මෙනෙවිය	අත්හදා බැලීමේ නිලධාරී

පි.ඒ.සී.ආර්. පුහාඹුගොඩ, NDT (Agric) (ලංකා)	අත්හදා බැලීමේ නිලධාරී
පි.ඩී.ටී.සී. ගුණතිලක	අත්හදා බැලීමේ නිලධාරී

ජෛවරසායන සහ කායිකවිද්‍යා දෙපාර්තමේන්තුව

වි.එච්.එල්. රොඩ්‍රිගෝ, BSc (Agri) (ලංකා), MSc (එසෙක්ස්) PhD (වේල්ස්)	දෙපාර්තමේන්තු ප්‍රධානී
කේ.වි.වි.එස්. කුඩලිගම විජේසුන්දර, BSc (ලංකා), MPhil (ලංකා)	සහකාර ජෛවරසායනඥ
ඩී. රාමවික්‍රම	අත්හදා බැලීමේ නිලධාරී
පි.ඩී.ජේ. රොඩ්‍රිගෝ	අත්හදා බැලීමේ නිලධාරී

උපයෝගිතා පර්යේෂණ ඒකකය

එස්.එම්.එම්. ඉක්බාල්, BSc (Agri) (ලංකා), MPhil (ලංකා), PhD (එසෙක්ස්)	ශෂ්‍ය විද්‍යාඥ
ඩබ්.ඒ.ඩී.ඩී.එස්. වෙත්තසිංහ	පර්යේෂණ සහකාර (උපයෝගිතා පර්යේෂණ)
ර්.එස්. මුණසිංහ මිය - BSc (Agric), (ලංකා)	පර්යේෂණ සහකාර
බි.එම්.ඩී.සී. බාලසූරිය මිය, BSc Agric (ලංකා)	පර්යේෂණ සහකාර